(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක 96.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 සැප්තැම්බර් මස 06 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

456/'16

1.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව මඟින්, කැළි කසළ බැහැර කිරීමේ ස්ථානය ලෙස හඳුනාගෙන තිබෙන රොටවැව, පොල්වත්ත ඉඩම අපවිත්‍ර වී එහි ජල මූලාශ්‍රයන් හානිවීමේ අවදානම් තත්ත්වයක් පවතින බව දන්නේද;

(ii) පානීය ජල ප්‍රශ්නය සහ වකුගඩු රෝගී තත්ත්වය උග්‍ර ලෙස පවතින එම පළාතේ ජනතාවට මෙයින් සිදුවන බලපෑම අවම කිරීම පිණිස ගනු ලබන පියවර කවරේද;

(iii) අවට පරිසරයට හානි නොවන අයුරින් ක්‍රමවත් ලෙස කැළි කසළ බැහැර කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

464/'16

2.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 ජනවාරි 01 දිනට ජනාධිපතිතුමා විසින් සිය කාර්ය මණ්ඩලයට පත්කර ඇති සියලුම උපදේශකවරුන්, ලේකම්වරුන්, සම්බන්ධීකරණ නිලධාරීන්, පෞද්ගලික සහකාරවරුන් සහ වෙනත් එවැනි නිලධාරීන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත (i) අනුව මුළු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (i)හි නිලධාරීන්ගේ නම් සහ එක් එක් නිලධාරියාට ලබා දී ඇති වැටුප්, දීමනා, කාර්ය මණ්ඩල සහ වෙනත් පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i)හි නිලධාරීන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

479/'16

3\.
ගරු කනක හේරත් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015 වර්ෂයේදී,

(i) ශ්‍රී ලාංකිකයින් විසින් පරිභෝජනය කළ සීනි ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(ii) පරිභෝජනය කරන ලද සීනි ප්‍රමාණයෙන් ආනයනය කළ සීනි ප්‍රමාණය කොපමණද;

(iii) ආනයනය කළ සීනි ප්‍රමාණයෙහි වටිනාකම කොපමණද;

(iv) දේශීය සීනි කර්මාන්තශාලාවලින් නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014 සහ 2015 වර්ෂවලදී දේශීය සීනි කර්මාන්තශාලාවලින් නිෂ්පාදනය කරන ලද සීනි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2014 වර්ෂයට සාපේක්ෂව, 2015 වර්ෂයේදී සීනි නිෂ්පාදනයේ වැඩිවීමක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

598/'16

4\.
ගරු ලකී ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පළමුවන ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා දෙන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක පෞද්ගලික පාසල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම පාසල්වල,

(i) නම් කවරේද;

(ii) පිහිටා තිබෙන ප්‍රදේශ කවරේද;

(iii) පවත්වාගෙන යන්නේ කවුරුන් විසින්ද;

(iv) ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රජයේ පාසල්වල මෙන්ම පෞද්ගලික පාසල්වලද වැඩි වශයෙන් අධ්‍යාපනය ලබන්නේ ශ්‍රී ලාංකික දරුවන් බවත්, පෞද්ගලික පාසල්වල අධික ගාස්තු අය කරන බවත්;

(ii) පෞද්ගලික පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම හා සාධාරණ මුදලක් අය කිරීම වැනි කටයුතු අධීක්ෂණය සහ නියාමනය කිරීමේ ක්‍රමවේදයක් කඩිනමින් සකස් විය යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) (ඇ) (ii) හි සඳහන් ක්‍රමවේදය සකස් කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

634/'16

5.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මූලික සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයන්, විධිමත් බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව වන්නි දිස්ත්‍රික්කයේ සමෘද්ධි නිලධාරීන් ලෙස බඳවාගෙන ඇති බව දන්නේද;

(ii) එලෙස සුදුසුකම් නොමැතිව බඳවාගෙන ඇති සමෘද්ධි නිලධාරීන්ගේ තොරතුරු කවරේද;

(iii) අවිධිමත් ලෙස පත්කර ඇති පුද්ගලයන් සේවයෙන් ඉවත් කර විධිමත් ලෙස අලුතින් නිලධාරීන් බඳවා ගැනීමට කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

665/'16

6.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පලාලි ගුවන් තොටුපළ නවීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ඉන්දීය රජය හෝ ඉන්දීය සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) එම ගිවිසුම සඳහා කැබිනට් මණ්ඩලයේ හා නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමතිය හෝ නිරීක්ෂණ සහිත ලියවිලි ඉදිරිපත් කරන්නේද;

(iv) මෙම කොන්ත්‍රාත්තුව අදාළ සමාගමට ලබා දී ඇත්තේ විවෘත ටෙන්ඩර් පටිපාටි අනුගමනය කිරීමෙන්ද;

(v) කොන්ත්‍රාත්තුවට අනුව මෙම නවීකරණය සඳහා යන වියදම කොපමණද;

(vi) නවීකරණ කටයුතු අවසන් කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

720/'16

7.

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෘෂිකර්මාන්තය ජීවනෝපාය කරගත් ජනතාව වැඩි වශයෙන් ජීවත් වන බවත්;

(ii) මෙම ප්‍රදේශයේ විශාල හා කුඩා වැව් රාශියක් ප්‍රතිසංස්කරණය නොකර අත්හැර දමා තිබෙන බවත්;

(iii) විශේෂයෙන් විශාල වැව් 16ක් හා කුඩා වැව් 48ක් කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයේ පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අ (iii) හි සඳහන් වැව් ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කරන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

724/’16

8\.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩවලව ජලසම්පාදන ක්‍රමයේ, පනහඩුව තොග ජල ටැංකියට ආසන්න පනහඩුව ගම්මානයේ අතුරු මාර්ගවලට ජල සැපයුම් ලබා නොදී ඊට ආසන්නව ප්‍රධාන නළ මාර්ගයක් එලීමට රජය වැයකර ඇති මුළු මුදල කොපමණද;

(ii) එමගින් ජල සැපයුම් ලබා ඇති පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් ජල පාරිභෝගිකයෙකු වෙනුවෙන් රජය දරා ඇති මුදල දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස නොමැති ඉඩම් කට්ටි 03ක් සඳහා මීටර් 850ක් දුරට ජල නළ එලා ඇති බව දන්නේද;

(ii) එම ජල සැපයුම් ලබාගත් පාරිභෝගිකයන් සමඟ රත්නපුර ප්‍රාදේශීය කළමනාකාරවරයාගේ පෞද්ගලික සම්බන්ධතාවයක් තිබේද;

(iii) තම නිල බලය භාවිතා කරමින් මෙම නිලධාරියා විසින් රාජ්‍ය මුදල් අවභාවිතා කර ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

(v) එම මුදල නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

729/’16

9\.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 අතුරු අයවැය මඟින් ‘මන්දිර බද්ද’ යනුවෙන් නව බද්දක් යෝජනා කර, 2016 අයවැය යෝජනා මඟින් එය තවදුරටත් බල ගැන්වූ බව පිළිගන්නේද;

(ii) එකී මන්දිර බද්ද අය කිරීමේ පදනම කවරේද;

(iii) 2015 සහ 2016 වර්ෂවලදී මෙම බද්දෙන් රජයට ලැබුනු මුළු බදු ආදායම කොපමණද;

(iv) ඉහත වර්ෂයන්හි දී මන්දිර බද්ද ගෙවනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

779/’16

10\.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මොරවක අධ්‍යාපන කලාපයේ, පාසැල් ගුරු භවතෙකු ලෙස තිස් වසරක් පුරා සේවය කර මීට වසර දෙකකට පෙර විශ්‍රාමගත් පූජ්‍ය දලුපොත උපාලි හිමියන් වෙත විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විශ්‍රාම වැටුප් අංකය ලෙස, 02/110/6342 යන අංකය ලබා දී ඇති බවත්;

(ii) පූජ්‍ය දලුපොත උපාලි හිමියන් වෙත හිමිවිය යුතු විශ්‍රාම වැටුප තවමත් ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) පූජ්‍ය දලුපොත උපාලි හිමියන්ට හිමිවිය යුතු විශ්‍රාම වැටුප තවදුරටත් ප්‍රමාදවීමකින් තොරව උන්වහන්සේ වෙත ගෙවන මෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නියෝග කරන බව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

784/'16

11.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගම්පහ දිස්ත්‍රික්කයේ, මල් හා විසිතුරු පත්‍ර ආශ්‍රිත කර්මාන්තයේ නියැලෙන්නන් 5000ක් පමණ සිටින බවත්, සමිති 28ක් මඟින් ක්‍රියාත්මක මෙම කර්මාන්තයට පසුගිය රජය දිරිගැන්වීම් ලබා දුන් බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම කර්මාන්තයේ නියැලෙන්නන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සංගණනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, ඕකිඩ්, ඇන්තූරියම් සහ විසිතුරු පත්‍ර වගාකරුවන්, අලෙවිකරුවන්, සුළු, මධ්‍යම සහ මහා පරිමාණ වගාකරුවන් සහ මල් අපනයනකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2015 දී හා 2016 මුල් කාර්තුවේදී (අ) හි සඳහන් පුද්ගලයන් දිරිගැන්වීමටත්, ව්‍යාපාරයේ රඳවා ගැනීමටත්, නවකයන් ව්‍යාපාරයට බඳවා ගැනීමටත් ගත් ක්‍රියා මාර්ග, ලබා දුන් සහන, ඊට වෙන් කළ මුදල සහ ප්‍රතිලාභ හිමිවූවන් සංඛ්‍යාව කොපමණද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය රජය විසින් කැළණිය විශ්වවිද්‍යාලය හරහා ගම්පහ උද්භිද උද්‍යානයේ රුපියල් මිලියන 22ක වියදමින් ඉදිකළ පටක රෝපණ මධ්‍යස්ථානයේ සිදුකළ පර්යේෂණ, ජනනය කර ඇති මල් ප්‍රභේද සහ පැල ලබා දුන් මල් ව්‍යාපාරිකයින් සංඛ්‍යාව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

790/'16

12.

ගරු විදුර වික්‍රමනායක මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජගිරියේ පිහිටි, වික්ටෝරියා නිවාසය වාට්ටු 14කින් සමන්විත වන අතර සුවකළ නොහැකි ආබාධිතයන් 153දෙනෙකු නේවාසිකව සිටින බවත්;

(ii) මෙම නිවාසයේ නේවාසිකයන්ගේ සියලු කටයුතුවලට මෙන්ම ජල, විදුලි, සේවක වැටුප් ඇතුළු පරිපාලන වියදම් සඳහා රජය මඟින් වාර්ෂිකව රුපියල් මිලියන 08ක පමණ මුදලක් ලබාදෙන බවත්;

(iii) එම මුදල එම කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන බවත්;

(iv) සේවකයන්හට ගෙවනු ලබන වැටුප් ප්‍රමාණවත් නොවීම නිසා අලුතින් සේවකයන් බඳවා ගැනීමට හැකියාවක් නොමැතිවීමෙන් සේවක මණ්ඩලයද ප්‍රමාණවත් නොවන බවත්;

(v) සේවක මණ්ඩලය සඳහා ප්‍රමාණවත් නිල නිවාස පහසුකම් නොමැති වීම සහ ප්‍රමාණවත් වැටුපක් නොලැබීම හේතුවෙන් මානසිකව පීඩාවට පත් වී සිටින සේවකයින්ගෙන්, ප්‍රශස්ත මට්ටමේ සේවයක් ලබා ගැනීම ගැටලුවක්ව පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වත්මන් සේවකයන්ගෙන් උපරිම සේවයක් ලබා ගැනීම සඳහා ඔවුන්ගේ වැටුප් වැඩි කිරීම සහ පහසුකම් ලබාදීමට පියවර ගන්නේද;

(ii) අලුතින් සේවකයන් බඳවා ගැනීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

791/'16

13.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝක ඉස්ලාම් රාජ්‍යයක් සඳහා ත්‍රස්තවාදය වපුරන ISIS සංවිධානයට ශ්‍රී ලාංකිකයන් බැඳී ඇති බව සත්‍යයක්ද;

(ii) එසේ නම්, මේ වනවිට ISIS ත්‍රස්තවාදය වෙනුවෙන් සටන් කරන බවට හෙළිදරව් වී ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ සටන් කරද්දී මියගිය බවට තොරතුරු අනාවරණය වී ඇති පුද්ගලයින් සිටින්නේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ඔවුන් මියගිය රටවල් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ISIS සංවිධානයේ ව්‍යාප්තිය පිළිබඳව සකස් කොට ඇති සැලසුම්වලට අනුව 2020 දී ශ්‍රී ලංකාවද ඔවුන්ගේ සටන්භූමියක් ලෙස තෝරගෙන ඇති බව සත්‍යයක්ද;

(ii) රාජ්‍ය බුද්ධි අංශ විසින් මේ වනවිට ISIS ත්‍රස්තවාදය ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ලබා දී ඇති උපදෙස් කවරේද;

(iii) එකී උපදෙස් ක්‍රියාත්මක කිරීම සඳහා බාධාවන් තිබේද;

(iv) ශ්‍රී ලංකාවේ කිසියම් දේශපාලන පක්ෂයක් හෝ සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් ISIS සංවිධානය සමඟ සම්බන්ධකම් පවත්වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

799/'16

14.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (SLEAS), ශ්‍රී ලංකා පරිපාලන සේවය (SLAS) වැනි සේවා සඳහා බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරඟ විභාග පවත්වනු ලබන්නේ කොළඹදී පමණක් බවත්;

(ii) කොළඹ විභාග මධ්‍යස්ථානවලදී පමණක් ඉහත කී විභාග පැවැත්වීම මඟින් දුර බැහැර ප්‍රදේශවල අයදුම්කරුවන්ට ගැටලුවලට මුහුණ දීමට සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අයදුම්කරුවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව අවධානය යොමු කර, ඉදිරි කාලයේදී උතුරු හා නැගෙනහිර පළාත්වල මෙවැනි විභාගයන් පැවැත්වීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා,— කාර්මික ආරවුල් පනත යටතේ නියෝග,— කලින් කලට සංශෝධනය කරන ලද, 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ (131 වැනි අධිකාරය වූ) 39 වැනි වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016.07.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— 2016 ජූනි 22 දිනැති අංක 1972/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින්, සිංහල හා දෙමළ භාෂා පිටපත්වල මුද්‍රණ දෝෂ නිවැරදි කරනු ලැබූ, මෝටර් වාහන පනතේ (203 වැනි අධිකාරය වූ) 122 වගන්තිය සහ VII අ කොටස සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 02 දිනැති අංක 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.07.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

නීති කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ නියෝග,— (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 63 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඊ) ඡේදය යටතේ 2013 ඉඩම් අත්පත් කර ගැනීමේ (වන්දි ගෙවීමේ) නියෝග සංශෝධනය සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූලි 26 දිනැති අංක 1977/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මැයි 26 දිනැති අංක 1968/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 13 දිනැති අංක 1971/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 13 දිනැති අංක 1971/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 3),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 28 දිනැති අංක 1973/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 4),—1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූලි 12 දිනැති අංක 1975/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 147 — වැඩසටහන 1,— † 2016 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන හා 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් දැනටමත් අනුමත කර ඇති වියදම් සීමා නොඉක්මවන පරිදි එහි විවිධ වැය ශීර්ෂ යටතේ අපේක්ෂිත ඉතිරිවීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂයේ "අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතියට" මාරුකර ගැනීමටත් 2015 අංක 16 දරන විසර්ජන පනතේ 6.1 හා 6.2 වගන්ති මඟින් සලසා ඇති විධිවිධානවලට යටත්ව හඳුනාගත් විදේශ මූල්‍යාකරණ සහිතව ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙමින් පරිපූරක ප්‍රතිපාදන ලෙස අදාළ අමාත්‍යාංශවලට මාරු කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයට අයත් අනෙකුත් ඕනෑම අරමුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් මූල්‍යාකරණය කරන ලද රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් (රු.592,925,000) නොඉක්මවන මුදලක් උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සලසා ගත යුතු ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 147 | - ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 1 | - මෙහෙයුම් වැඩසටහන | |
| පුනරාවර්තන වියදම් | | - | රු. 469,425,000 |
| මූලධන වියදම් | | - | රු. 123,500,000 |
| | | මුළු වියදම = | **රු. 592,925,000** |

(රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් පමණි.)

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම**

| | |
|---|---|
| උපරිම වියදම් සීමාව | - රු. 2,000,000 |
| අවම ලැබීම් සීමාව | - රු. 150,000 |
| උපරිම හර ශේෂ සීමාව | - රු. 3,500,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2016 අගෝස්තු මස 09 වැනි දින ඉදිරිපත් කරන ලද 2016 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රුපියල් 55,000,000.

*16.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවදානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාවය මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධූරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරි ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයින්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— “ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*19.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

22.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**